ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

Invest in Sri Lanka

Sri Lanka Tourism

Development Authority

සංචාරක සංවර්ධන අරමුදල

2011

වාර්ෂික වාර්තාව

2012 මැයි 25

ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා පා. ම.
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා

ගරු ඇමතිතුමනි

<u>සංචාරක සංවර්ධන අරමුදල</u>

2005 අංක 38 දරණ සංචාරක සංවර්ධන පනතේ 23 (1) වගන්තිය අනව සංචාරක සංවර්ධන අරමුදල ස්ථාපිත වී ඇති අතර මෙම අරමුදලෙහි මුල්‍යයන් සංචාරක සංවර්ධන සහ ප්‍රවර්ධනය වෙනුවෙන් යෙදවිය යුතු වේ. මෙම අරමුදල වෙනුවෙන් මුල්‍යයන් එකතු කිරීම් සහ බෙදා හැරීම් 2003 අංක 25 දරණ මුදල් පනත සහ 2005 අංක 38 දරණ සංචාරක පනත අනුව තීරණය වේ.

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (2) (අ) වගන්තිය අනුව සංචාරක අපගමන බදු ආදායමෙන් 1/3 ක ප්‍රමාණයක් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවනු ලැබේ. තවද, සංචාරක ක්ෂෙත්‍රයට අයත් ආයතන වලින් කාර්තු පදනම මත සංචාරක සංවර්ධන බදු වශයෙන්ද මෙම අරමුදලට එකතු වේ.

2011 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදයට අදාල සංචාරක සංවර්ධන මුල්‍යයන්හි එකතුව රුපියල් මිලියන 1695.1 ක් වේ. 2010 වසරේ එම මුල්‍ය ප්‍රමාණය රුපියල් මිලියන 1517.01 ක් වේ.

මෙම වාර්තාව මගින් 2011 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලට මුල්‍යය එකතු වීම සහ මුල්‍යයන් බෙදා හැරීම සම්බන්ධ විස්තර අඩංගු වී ඇත.

ස්තුතියි

මෙයට විශ්වාසී

අ/කලේ

විපුල වනිගසේකර
වැ. බ. අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

පටුන

- මූල්‍ය ප්‍රකාශන
- විගණකාධිපති වාර්තාව

සංස්ථාපිත තොරතුරු

අරමුදලේ නම	**සංචාරක සංවර්ධන අරමුදල**
නීතිමය රාමුව	**2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (1) වගන්තිය යටතේ ස්ථාපිත වේ.**
අරමුදල කළමනාකරණය සහ පරිපාලනය	**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**
විගණකයින්	**විගණකාධිපති දෙපාර්තමේන්තුව කොළඹ 07.**
බැංකු කරුවන්	**ලංකා බැංකුව කොළඹ 01.**

මූල්‍ය ප්‍රකාශන - පටුන

	පිටු අංක
මූල්‍ය තත්වය පිළබඳ ප්‍රකාශනය	01
මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශනය	02
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	03
ගිණුම් වලට අදාල සටහන්	04-07

සංචාරක සංවර්ධන අරමුදල
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
2011 දෙසැම්බර් 31 දිනට

	සටහන	2011	2010
		රු.	රු.
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන අයිතමයන්		138,067,762.60	85,154,824.63
ලැබිය යුතු මූල්‍ය	8	341,571,004.93	350,340,624.99
මුළු වත්කම්		**479,638,767.53**	**435,495,449.62**
ජංගම වගකීම්			
ගෙවිය යුතු මූල්‍යයන්	9	1,619,289.73	59,940.00
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය		66,922,726.88	61,892,703.52
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය		334,613,634.44	304,046,470.07
ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය		57,362,337.37	52,122,252.04
ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය		19,120,779.11	17,374,083.99
මුළු වගකීම්		**479,638,767.53**	**435,495,449.62**

අ/කලේ
ආචාර්ය නාලක ගොඩහේවා
සභාපති
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

අ/කලේ
පී. එන්. දිසානායක
අධ්‍යක්ෂ / මූල්‍ය කළමනාකරණ
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

සංචාරක සංවර්ධන අරමුදල
මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය
2011 දෙසැ. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	2011 රු	2010 රු
ආදායම			
බදු	3	1,691,346,520.87	1,513,391,234.60
අනෙකුත් ආදායම්	4	3,842,679.71	3,628,651.14
මුළු ආදායම්		**1,695,189,200.58**	**1,517,019,885.74**
වියදම්			
අරමුදලේ පරිපාලන වියදම්	5	3,343,507.72	2,908,287.21
මූල්‍ය පිරිවැය	6	396,511.88	784,385.48
අරමුදල බෙදාහැරීම	7	1,691,449,180.98	1,513,327,213.05
මුළු වියදම		**1,695,189,200.58**	**1,517,019,885.74**
අතිරික්තය (ඌනතාවය) කාල පරිච්ඡේදය සඳහා		-	-

සංචාරක සංවර්ධන අරමුදල

මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2011
	රු:
මුල්‍ය ප්‍රවාහය මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින්	
ශුද්ධ අතිරික්තය (ඌනතාවය) මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින්	-
කාරක ප්‍රාග්ධනයේ වෙනස - මුල්‍ය ගලා ඒම් (ගලා යාම්)	
වැඩි වීම / අඩු වීම මුල්‍ය ලැබීම්	8,769,620.06
වැඩි වීම / අඩු විම මුල්‍ය ගෙවීම්	44,143,317.91
ශුද්ධ මුදල් ප්‍රවාහය මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින්	52,912,937.97
මුදල් සහ මුදල් සමාන දේ මුල් කාල පරිච්ඡේදය සඳහා	85,154,824.63
මුදල් සහ මුදල් සමාන දේ අවසන් කාල පරිච්ඡේදය සඳහා	138,067,762.60

ගිණුම් වලට අදාල සටහන්

1. සංචාරක සංවර්ධන අරමුදල

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (1) වගන්තිය යටතේ සංචාරක අරමුදල ස්ථාපිත වී ඇත. මෙම අරමුදලේ මුල්‍යයන් සංචාරක සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා යෙදවිය යුතු වේ. මෙම අරමුදලේ මුල්‍ය එකතු වීම සහ බෙදා හැරීම 2033 අංක 28 දරණ මුදල් පනතේ සහ 2005 අංක 38 දරණ සංචාරක පනත අනුව සිදු වේ.

2. ගිණුම්මය අවශ්‍යතා

මෙම අරමුදලේ ගිණුම් කටයුතු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා රාජ්‍ය අරමුදල් ගිණම්කරණ ප්‍රමිතීන් අනුව සිදු වේ.

3. බදු - අරමුදල් සම්පත්

	2011 රු.	2010 රු.
අපගමන බදු	1,041,678,481.63	1,000,077,336.72
සංචාරක සංවර්ධන බදු	649,668,039.24	516,942,546.02
එකතුව	**1,691,346,520.87**	**1,517,019,882.74**

3.1 අපගමන බදු

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23(2) (අ) වගන්තිය යටතේ අපගමන බදු වලින් 1/3 ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ගෙවනු ලැබේ.

අපගමන බදු	රු.
2011 ජන. - ඔක්. අපගමන බදු ලැබීම්	865,304,781.87
2011 වසරට අපගමන බදු ලැබිය යුතු (වෙන් කිරීම)	176,373,699.76
2011 වසර සඳහා අපගමන බදු එකතුව	**1,041,678,481.63**

3.2 සංචාරක සංවර්ධන බදු

2005 අංක 28 දරණ මුදල් පනත යටතේ සංචාරක ක්ෂේත්‍රයට අයත් සැම ආයතනයක්ම සංචාරක සංවර්ධන බදු ගෙවිය යුතු වේ. මෙම සංචාරක සංවර්ධන අරමදල් බදු එකතු කිරීම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කර සංචාරක සංවර්ධන අරමුදලට බැර කරනු ලැබේ. 2011 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුල එකතු කරන ලද සංචාරක සංවර්ධන අරමුදල් බදු ප්‍රමාණය රුපියල් මිලියන 443.83 ක් වේ. තවද 2011 ඔක්තෝබර් - දෙසැම්බර් කාල පරිච්ඡේදය තුල ලැබිය යුතු මුල්‍ය (ඇස්තමේන්තු) ප්‍රමාණය රුපියල් මිලියන 165 ක් වේ.

සංචාරක සංවර්ධන බදු	රු:
2011 ජනවාරි - දෙසැම්බර් දක්වා ලැබු මුල්‍යයන්	443,835,945.00
2011 ඔක්තෝබර් - දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුල්‍යයන්	165,000,000.00
පූර්ව වර්ෂය වෙනුවෙන් ලැබුනු මුල්‍යයන්	41,722,418.29
සංචාරක සංවර්ධන බදු ආපසු ගෙවීම්	(890,324.05)
2011 ජනවාරි - දෙසැම්බර් දක්වා සංචාරක සංවර්ධන බදු	**649,668,039.24**

3.2.1 පූර්ව වර්ෂයේ ආදායම

2010 වර්ෂය වෙනුවෙන් සංචාරක සංවර්ධන බදු මුල්‍යයන් ලැබිය යුතු ඇස්තමේන්තු රු.124,000,000.00 ක ප්‍රමාණයක් මෙම වසරේදී ලැබි ඇත. එනමුත් සත්‍ය වශයෙන්ම මෙම කාල පර්ච්ඡේදය සඳහා ලැබුණ මුල්‍ය ප්‍රමාණය රු. 165, 722,418.29 කි. ඒ අනුව ඌන ඇස්තමේන්තු ගත ප්‍රමාණය රු. 41,722,418.29 කි. 2011 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම හඳුනා ගත මුල්‍ය වෙනසේ ප්‍රමාණය ප්‍රවර්ථන වර්ෂයේ ආදායමක් ලෙස සලකා ඇත.

4. වෙනත් ආදායම්

මුල්‍ය පනත අනුව සංචාරක සංවර්ධන බදු නොගෙවන ආයතන වලින් බදු අයකර ගැනීමේදී බදු පමා කිරීමේ අනුපාතිකය ලැබෙන පොලිය අමතර ආදායමක් ලෙස අරමුදලට ලැබේ.

	රු:
2011 වසර සඳහා බදු පමා කිරීමේ පොලිය එකතු වීම	3,842,572.71
අතිරික්ත ලැබීම් / චෙක්පත් අගරු වු හිමියෙකුගෙන්	107.00
එකතුව	**3,842,679.71**

5. අරමුදල පරිපාලන පිරිවැය

	2011 රු:	2010 රු:
මුද්දර ගාස්තු	45,450.00	37,825.00
පරිපාලන පිරිවැය	3,268,797.72	2,788,892.21
විගණන ගාස්තු	29,100.00	81,570.00
තැපැල් ගාස්තු	160.00	-
එකතුව	**3,343,507.72**	**2,908,287.21**

6. මූල්‍ය පිරිවැය

	2011 රු.	2010 රු.
හර බදු	385,051.83	774,790.31
බැංකු ගාස්තු	11,460.00	9,595.17
එකතුව	**396,511.83**	**784,385.48**

7. අරමුදල බෙදා හැරීම

2005 අංක 38 දරණ සංචාරක පනතේ 24 (8) වගන්තියට අනුව අරමුදලට එකතු වන මූල්‍යයන් බෙදා හරිනු ලබයි.

	2011 රු.	2010 රු.
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	236,802,885.34	211,865,811.89
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය	1,184,014,426.66	1,059,329,045.53
ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය	202,973,901.73	181,599,267.24
ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය	67,657,967.25	60,533,088.39
එකතුව	**1,691,449,180.98**	**1,513,327,213.05**

8. ලැබිය යුතු මුල්‍යයන්

	2011 රු.	2010 රු:
අපගමන බදු ලැබිය යුතු	176,373,699.76	225,467,381.82
සංචාරක සංවර්ධන බදු ලැබිය යුතු	165,000,000.00	124,000,000.00
ණයගැතියන්	197,305.17	873,243.17
එකතුව	**341,571,004.93**	**350,340,624.99**

9. ගෙවිය යුතු මුල්‍යයන්

	2011 රු:	2010 රු:
උපචිත වියදම් - පරිපාලන ගාස්තු	1,515,338.82	1,045,584.52
උපචිත වියදම - විගණන ගාස්තු	29,100.00	59,940.00
උපචිත වියදම - මුද්දර ගාස්තු	17,500.00	37,825.00
වෙනත් ජංගම වගකීම්	57,350.91	-
එකතුව	**1,619,289.73**	**1,143,349.52**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. } ටීඑම්/එච්/ටීඩීඑෆ්/එෆ්ඒ/2011

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2012 මැයි 31 දින.

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

සංචාරක සංවර්ධන අරමුදලේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

සංචාරක සංවර්ධන අරමුදලේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහාවූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2005 අංක 38 දරන සංචාරක පනතේ 20 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 <u>**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>**විගණකගේ වගකීම**</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී, ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව

இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை

No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. } 2887220

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887221

ඉලෙක්ට්‍රොනික් තැපැල් / மின்-அஞ்சல் / E-mail. } oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම්වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වු අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ තත්වාගණනය කළ මතය සහ පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණාත්මක හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට සංචාරක සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වු මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වටිනාකම රු. 143,504 ක් වු අගරු වු චෙක්පත් 07 ක් වර්ෂ 2 සිට 7 දක්වා කාලයක් මුළුල්ලේ පියවා නොතිබුණද, මුදල් රෙගුලාසි අංක 189 ප්‍රකාරව චෙක්පත් වල වටිනාකම අයකර ගැනීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

2.2.2 **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2005 අංක 38 දරන සංචාරක පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව සහ 2003 අංක 25 දරන මුදල් පනතේ 11 කොටස ප්‍රකාරව සංචාරක බදු අයකර ගැනීම් වාර්තා සංචාරක සංවර්ධන බදු (සං.සං.බ.) අයකර දින 30 ක් ඇතුළත මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ඉදිරිපත් කළයුතු වේ. එසේ වුවත් අරමුදල මෙම නියමයන්ට අනුකූල වී නොතිබුණි.

(ආ) 2005 අංක 38 දරන සංචාරක පනතේ 24 (4) වගන්තිය ප්‍රකාරව, සං.සං. බදු ගෙවීම් පිළිබඳ විස්තර දක්වා ලේඛනයක් පවත්වා නොතිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ වැඩ කටයුතු වලින් ජනනය වූ ආදායම රු.මිලියන 1,695 ක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ආදායම රු. මිලියන 1,517 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 178 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

3.2 අරමුදල කළමනාකරණය

2005 අංක 38 දරන සංචාරක පනතේ විධිවිධාන වලට අනුව අරමුදලේ කාර්යයන් සිදුකළ යුතුය. අරමුදල කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2003 අංක 25 දරන මුදල් පනතේ 12 වගන්තිය ප්‍රකාරව සෑම බලපත්‍ර හිමි ආයතනයකින්ම එහි පිරිවැටුම මත සංචාරක බදු අයකළ යුතුය. එසේ වුවත් බලපත්‍ර හිමි ආයතන 2,372 ක් අතරින් ආයතන 1089 කින් බදු අයකර ගෙන නොතිබුණි.

(ආ) විගණනය කරන ලද ගිණුම් වාර්තා නොමැතිව රු.492,490 ක් වූ සංචාරක සංවර්ධන බදු ගෙවූ තැනැත්තා වෙත නැවත ගෙවා තිබුණි.

(ඇ) අරමුදල මගින් පරිපාලන වියදම් ලෙස රු.3,343,507 මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. එසේ වුවත්, පරිපාලන වියදම් ගෙවීමට 2005 අංක 38 දරන සංචාරක පනතේ විධිවිධාන සලසා නොතිබුණි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා 2012 මැයි 02 දින පහත පරිදි මා වෙත වාර්තා කර තිබුණි.

"පනත අනුව සං.සං. බදු පරිපාලනය හා කළමනාකරණය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කළයුතුය. මේ අරමුණ සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සේවක වැටුප්, දත්ත මෙහෙයුම් වත්කම්වල ක්ෂය, ලිපි ද්‍රව්‍ය යනාදි වියදම් දැරිය යුතු අතර අරමුදල දරන වියදම් වෙනුවෙන් වියදම් ප්‍රතිපූරණය කර ගැනීමට වෙනත් ආයතනයක් නොමැත. මෙම කරුණු සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පාලක මණ්ඩලය විසින් සාමාන්‍ය ගාස්තුවක් අරමුදලින් අයකර ගැනීමට තීරණය කළ අතර එය සමස්ථ ආයතන හතර මගින් බෙදා ගැනීමට නියමිතය."

3.3 අභ්‍යන්තර විගණනය

අරමුදලේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය මගින් ආවරණය කළයුතුය. එසේ වුවත් සමාලෝචිත වර්ෂය තුළදී මෙකී විගණන අංශය මගින් කිසිදු විගණන කාර්යයක් අරමුදලේ කාර්යයන් සම්බන්ධයෙන් සිදුකර නොතිබුණි.

4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අරමුදල් බෙදා හැරීම

(ඇ) සංචාරක සංවර්ධන බදු එකතු කිරීම

(ඈ) බලපත්‍ර නිකුත් කිරීම

(ඉ) බලපත්‍ර හිමි ආයතනවල මුල්‍ය වාර්තා සමාලෝචනය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති